# ශ්‍රී ලංකාවේ සරසවි සිසුන් සඳහා රජයේ සුබසාධන වියදම් වල කාර්යක්ෂමතාවය

**ඩී. එන්. ප්‍රනාන්දු**[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල වල ශිෂ්‍ය සුබසාධනය උදෙසා රජය විසින් විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව වැය කළ ද එම සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් තුළ මෙන්ම සැපයෙන සේවාවන් තුළ ද දැඩි අකාර්යක්ෂමතාවයක් පවතින බව පෙනේ. එම නිසා රජය විසින් ලබාදෙන සුබසාධන වියදම් වල කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණයි. එබැවින් මේ පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ආශ්‍රයෙන් එහි විවිධ පීඨ වල ඉගෙනුම ලබන සිසුන්ගෙන්  එක් එක් අධ්‍යයන වර්ෂ වල ඉගෙනුම ලබන සිසුන්ගෙන් ස්තරායන අහඹු නියැදි ක්‍රමය යටතේ 300 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එමෙන්ම එක් එක් පීඨවල ඉගැන්වීම් කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මෙන්ම එකී පීඨවල සිසුන් සම්බන්ධයෙන් විවිධ මට්ටම් වල කටයුතු කරන ආචාර්යවරුන් ද ඇතුළත් වන පරිදි අහඹු නියැදි ක්‍රමය යටතේ 25 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එමෙන්ම පරිපාලන නිලධාරීන්ගේ ලැයිස්තුවක් සකස් කර එම ලැයිස්තුව තුළින් ද 10 දෙනෙකුගෙන් යුත් අහඹු නියැදියක් තෝරා ගන්නා ලදී. විශ්වවිද්‍යාල සිසුන්ගේ දත්ත රැස් කර ගැනීමේදී ප්‍රශ්න මාලා ක්‍රමය ද ආචාර්යවරුන්ගේ හා පරිපාලන නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිතා කරන ලදී. ප්‍රතිපායනය, සහ සම්බන්ධතාවය, ප්‍රතිශත යන සංඛ්‍යාන විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතයෙන් දත්ත විශ්ලේෂණයට කටයුතු කරන ලදී.  සමස්ත සුබසාධන සේවාවන්ගේ  කාර්යක්ෂමතාවය කාර්යක්ෂම තත්වයක පවතින බව සිසුන්ගෙන් 6% ක ගේ අදහස වූ අතර කාර්යක්ෂතාවය දුර්වලය යන්න 36% ක ගේ ද අකාර්යක්ෂම තත්වයක පවතී යන්න 45% කගේ ද කිසිදු කාර්යක්ෂමතාවයක් නැත යන්න 13% ක ගේ ද අදහස විය. මේ අනුව නිගමනය කළ හැක්කේ කැලණිය විශ්වවිද්‍යාලයේ සුබසාධන කටයුතු වල සෑම අංශයක් සඳහාමත්, සෑම කාර්යයක් සඳහාමත් යෙදවිය හැකි සම්පත් ඉතා සීමාසහිත බවයි. මේ අනුව කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා රජය දරන සුබසාධන පහසුකම් පිරිවැයෙහි ආර්ථික කර්යක්ෂමතාවය ඉතා පහළ මට්ටමක පවතී.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල, සිසුන්, රජය, කාර්යක්ෂමතාවය

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, fernandonavodani@gmail.com